www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ස්ටැලින් හිට්ලර් ගිවිසුමේ සිට හැත්තෑ වසරක්

## 70 years since the Hitler-Stalin Pact

**2009 අගෝස්තු 24**

අවුරුදු හැත්තෑවකට පෙර, 1939 අගෝස්තු 23 දා, නාසි විදේශ ඇමති ජෝකිම් වොන් රිබෙන්ට්‍රොප් හා ජෝසෆ් ස්ටැලින්ගේ ප්‍රධාන හෙන්චයියෙකු වූ විචෙස්ලාව් මොලටෝව්, හිට්ලර්වාදී ජර්මනිය හා රුසියාව අතර කඩිමුඩියේ සාකච්ඡා කර එකඟවූ අනාක්‍රමනික ගිවිසුමකට අත්සන් තැබීම සඳහා මොස්කව්හි දී මුනගැසුනහ.

මෙම ගිවිසුමේ ප්‍රතිවිපාක වශයෙන්, නාසීන්ට අතිශයින්ම වාසිදායක කොන්දේසි යටතේ, යුරෝපය තුල යුද්ධයක් සඳහා ජර්මනියට ඉඩ සලසනු ලැබිනි. රිබෙන්ට්‍රොප් මොස්කව් වලට යන අවස්ථාව වන විට නාසි පාලන තන්ත්‍රය, සෝවියට් සංගමයටත් බටහිර යුරෝපයේ ප්‍රධාන බලවතුන් දෙදෙනා වූ මහා බ්‍රිතාන්‍යය හා ප්‍රන්සයටත් එරෙහිව පෙරමුනු දෙකක දී යුද්ධයකට පැටලීම මගහරිමින්, පෝලන්තයට පහර දීම සඳහා සෝවියට් සංගමය සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීමට මංමුලා සහගත උත්සාහයක නිරතව සිටියේය. අනාක්‍රමනික එකගතාවට අමතරව, ගිවිසුමේ අඩංගු වගන්ති වලට අනුව, පෝලන්තය හා බෝල්ටික් රටවල්, නාසි ජර්මනිය හා සෝවියට් සංගමය අතර බෙදාගැනීමේ රහසිගත සම්මුතියක් ද විය. බටහිර පෝලන්තය හා ලිතුවේනියාව ජර්මනියට ලබාදීමට නියමිත වූ අතර රුසියාව නැගෙනහිර පෝලන්තය, ලැට්වියාව හා එස්තෝනියාව අත්පත් කර ගැනීමට නියමිත විය.

1939 සැප්තැම්බර් පලමුවෙනි දා නාසීන් විසින් පෝලන්තය ආක්‍රමනය කිරීමෙන් පසුව සැප්තැම්බර් 3 දින යුද්ධය පිලිබඳ නිල ප්‍රකාශය නිකුත් විය. මෙය යුරෝපය තුල දෙවන ලෝක සංග්‍රාමයේ ආරම්භක වෙඩි මුරයයි. යුද්ධය, මිලියන 50 ත් 70 ත් අතර සංඛ්‍යාවක් ජීවිත බිලි ගත්තේය. සෝවියට් හමුදාවෝ 1939 සැප්තැම්බර් 17දා නැගෙනහිර පෝලන්තයට ඇතුලු වූහ.

ඉක්මනින්ම පෝලන්ත හමුදා පරාජය කිරීමෙන් පසුව, 1940 දී බටහිර යුරෝපයට එරෙහිව හමුදා බලමුලු ගැන්වීමට, සෝවියට් සංගමයේ උදාසීනත්වය තුලින් නාසීන්ට අවස්ථාව උදාවිය. ස්ටැලින්ගේ එකඟත්වය ද ඇතිව හිට්ලර්, ඩෙන්මාර්කය, නොර්වේ, නෙදර්ලන්තය, බෙල්ජියම හා ප්‍රන්සය යටත් කලේය. නොවැලැක්විය හැකි පරිදිම, 1941 දී සෝවියට් සංගමය කරා ආක්‍රමනය මෙහෙය වන විට, රුසියාව යුරෝපීය මහාද්වීපය තුල මුලුමනින්ම හුදෙකලා ජාතියක් විය. නාසි ආක්‍රමනය ආසන්න බවට පලව තිබූ ඉමහත් තොරතුරු නොසලකා හල ස්ටැලින්, ගිවිසුමේ කොන්දේසි බදාගෙන සිටියේය. 1941 ජූනි 22 දින උදෑසන, ආක්‍රමනය ඇරඹීමට පැය කිහිපයකට පෙර ක්‍රෙම්ලිනය, ගිවිසගෙන තිබූ පරිදි සිය අවසාන මූලෝපායික අමුද්‍රව්‍ය තොගය ජර්මනිය වෙත නැව් ගත කලේය.

ගිවිසුමේ අතිශය වැදගත් කොටස වූයේ, ජාත්‍යන්තර කම්කරු පන්තිය කෙරෙහි ක්‍රෙම්ලිනය දැක්වූ පරිපූර්න නොතැකීම හා සතුරු කමයි. සාකච්ඡාවන් පැවැත්වෙන අතර තුර ස්ටැලින්, “ජර්මනියේ පීතෘවරයා පිලිබඳව ජර්මන් ජනතාව දක්වන ආදරය ගැන මම දන්නෙමි” යි පවසමින් හිට්ලර්ට සවුදිය පිරුවේය. ක්‍රෙම්ලිනයේ මඟ අනුගමනය කරමින් ප්‍රන්සයේ හා බ්‍රිතාන්‍යයේ කොමියුනිස්ට් පක්ෂ, ෆැසිස්ට් පාලනය කෙරෙහි මධ්‍යස්ථ වීමේ කම්කරු විරෝධී, ප්‍රතිගාමීත්වයේ නිල ප්‍රතිපත්තිය පිලිගත්තේ ය.

නාසි හා සෝවියට් යන දෙපාර්ශවයේම හමුදා, යටත් කරගත් ප්‍රදේශ තුල මහා පරිමානයේ අපරාධ සිදු කලහ. පෝලන්තයේ සංස්කෘතික, බුද්ධිමය හා දේශපාලන ජීවිතයට සම්බන්ධ දස දහස් ගනන් පුද්ගලයෝ කොටුකරමින් හා මරා දමමින් නාසි හමුදා ටැනන්බර්ග් මෙහෙයුම දියත් කලහ. 1940 මාර්තුවේ දී සෝවියට් හමුදා කැටියන් වනාන්තරයේදී පෝලන්ත නිලධාරීන් සංහාරයක් සංවිධානය කලහ.

ගිවිසුම පිලිබඳ සාකච්ඡා තුලදී ස්ටැලින්, ජර්මානු කොමියුනිස්ට් නායක අර්නස්ට් තෙල්මාන් නිදහස් කරන ලෙස නාසීන්ගෙන් ඉල්ලා නොසිටීම ගැන හිට්ලර් මවිතයට පත්විය. 1933 ජනවාරියේදී නාසීන් බලයට පැමිනීමෙන් පසුව සිරගත කරන ලද තෙල්මාන් තෙවෙනි සමූහාන්ඩුව බිඳ වැටීමට ටික දිනකට කලින් නාසීන් විසින් මරා දමනු ලැබිනි.

ස්ටැලින් හිට්ලර් ගිවිසුම මතුපිටින් ගත් කල ජර්මනිය හා සෝවියට් සංගමය යන දෙරටෙහි ම විදේශ ප්‍රතිපත්තිය කනපිට හැරවීමක් විය. නාසි පාලන තන්ත්‍රය, සෝවියට සංගමයේත් කොමියුනිස්ට්වාදයේ තර්ජනයටත් එරෙහි පවුරක් ලෙස තමන්ම පෙනී සිටියහ. තමන්ගේ පැත්තෙන් ස්ටැලින්වාදී තන්ත්‍රය, නාසි අධිරාජ්‍යවාදයේ ක්ෂමා විරහිත සතුරෙකු ලෙස පෙනී සිටියහ. ඒ අනුව බ්‍රිතාන්‍යය හා ප්‍රන්සය, ගිවිසුම අත්සන් තැබීම දෙස තුෂ්නිම්භූතව හා සැක සහිතව බලා සිටියේය. කෙසේ වෙතත් සෝවියට් සංගමයේ වියදමෙන් හිට්ලර් සමග ගිවිසුම් ගැසීමට බලා සිටි යුරෝපීය අධිරාජ්‍යවාදීන් දෙදෙනා තුල, ගිවිසුම හෙලා දැකීමේදී කුහකත්වයේ අංශු මාත්‍රයක් වත් නොවීය.

1939 අගෝස්තු වන තෙක්, ප්‍රන්ස හා බ්‍රිතාන්‍ය පාලක පන්තියේ බලගතු කන්ඩායම්, බටහිර දෙසට නොව සෝවියට් රුසියාවට එරෙහිව හිට්ලර් යුද තර්ජනය එල්ල කරනු ඇතැයි බලාපොරොත්තු වූහ. 1939 මියුනිච් ගිවිසුමෙහි පදනම වූයේ මෙයයි. කමකට නැති නාසි පොරොන්දු වල හුවමාරුව බ්‍රිතාන්‍ය අගමැති නෙවිල් චෙම්බර්ලේන් විසින් හැඳින්වූයේ "අපේ කාලයේ සාමය" යනුවෙනි. බ්‍රිතාන්‍යය හා ප්‍රන්සය, නාසීන් විසින් චෙකොස්ලොවේකියාව බෙදා වෙන් කිරීමට එකඟත්වය පල කලහ.

සෝවියට් ප්‍රතිපත්තියේ කනපිට හැරීම පුදුමයක් ලෙස නොදුටු එක් පුද්ගලයෙක් විය. ඔහු නම් මේ වන විට දේශපාලන පිටුවහලෙකු ලෙස මෙක්සිකෝවේ ජීවත්වූ හතරවන ජාත්‍යන්තරයේ නායක ලියොන් ට්‍රොට්ස්කි ය.

තියුනු අභ්‍යන්තර අර්බුද වලට ද ඔහුගේම පිලිවෙත් මඟින් උත්පාදනය කල යුරෝපීය සතුරු රාජ්‍ය පෙලකට ද මුහුන දෙමින්, හිට්ලර් සමඟ සන්ධානයකින් ආක්‍රමනික තර්ජනය වලක්වා ගැනීමට, ස්ටැලින් උත්සාහ දරනු ඇති බවට, ඔහු සතු ආවේනික දුර දක්නා බවින් යුතුව ට්‍රොට්ස්කි අනාවැකි පල කලේය. 1939 ජූනි මාසයේදී ට්‍රොට්ස්කි මෙසේ ලිවීය. "මෙම වසරේ මාර්තු වල පැවති පක්ෂ සමුලුවේ දී, සෝවියට් සංගමය ආර්ථික වශයෙන් බටහිර රටවලට වඩා බොහෝ පසු පසින් සිටින බව ස්ටැලින් පලමු වරට විවෘතව ප්‍රකාශ කලේය. මෙම පිලිගැනීම ප්‍රකාශයට පත්කිරීමට සිදු වූයේ, විදේශ ප්‍රතිපත්තියේ පසුබෑම විස්තර කිරීමට පමනක් නොවේ. සාමය සඳහා කිසිදු කේවලයකින් තොරව, ආදරයෙන් ගෙවීමට ස්ටැලින් සූදානම්ය. ඔහු යුද්ධයට වෛර කරන නිසා නොව, එහි ප්‍රතිවිපාක වලට ඇති ඉමහත් බිය නිසාය.

"මෙම දෘෂ්ටි ආස්ථානයේ සිට, විකල්ප දෙකෙන් ක්‍රෙම්ලිනයට ලැබෙන තුලනාත්මක ප්‍රතිලාභ අගැයීම අපහසු නැත. ජර්මනිය සමඟ ගිවිසුම හෝ "ප්‍රජාතන්ත්‍රවාදය" සමඟ සන්ධානය. හිට්ලර් සමඟ මිත්‍රත්වයේ අර්ථය වනු ඇත්තේ, බටහිර පෙරමුනේ යුද අන්තරාය වහාම ඉවත්වී යාමයි. ඒ මඟින් ඈත පෙරදිගින් එල්ල වන යුද අනතුර විශාල වශයෙන් අඩුවී යාමයි. ප්‍රජාතන්ත්‍රවාදීන් සමඟ සන්ධානයේ අර්ථය වනු ඇත්තේ යුද අවස්ථාවක දී ආධාර ලැබීමේ හැකියාව පමනි. සැබවින්ම, සටන් කිරීම හැර වෙනත් දෙයක් නැත්නම්, හුදෙකලාව සිටීමට වඩා හවුල්කාරයන් සීටීම වඩා වාසි සහගතය. එහෙත් ස්ටැලින්ගේ විදේශ ප්‍රතිපත්තියේ මූලික කර්තව්‍ය, යුද තත්ත්වයක් ඇති වුවහොත් එයට ඉතාමත් හිතකර තත්ත්වයන් ඇති කිරීම නොව, යුද්ධය මග හැරීමය." 'සෝවියට් සංගමයට මිත්‍රයන් අවශ්‍ය නැත' යන ස්ටැලින් මොලටොව් හා වොරෂිලොව් ගේ නිරන්තර ප්‍රකාශයන්ගේ සැඟවුන අර්ථය මෙයයි. ["The Riddle of the USSR," *The Writings of Leon Trotsky, 1938-1939* ("සෝවියට් සංගමයේ ප්‍රෙහේලිකාව" ලියොන් ට්‍රොට්ස්කිගේ ලේඛන, 1938-39 නිව් යෝර්ක් පාත් ෆයින්ඩර් ප්‍රෙස්, 2002, පිටු 403-404)]

ට්‍රොට්ස්කි, කෙම්ලිනයේ විදේශ ප්‍රතිපත්තිය පිලිබඳ සිය නිරීක්ෂන පදනම් කලේ, සෝවියට් නිලධාරි තන්ත්‍රය පසුකර ආ දශකයෙහි හඹා ගිය ප්‍රති විප්ලවවාදී ප්‍රතිපත්ති පිලිබඳ පුලුල් අගැයීමක් මතය.

1933 දී හිට්ලර් බලයට පත්වීමෙන් පසුව සෝවියට්-ජර්මානු යුද බිය වැඩිවනවාත් සමඟ ක්‍රෙම්ලිනය, ෆැසිස්ට්වාදයට එරෙහිව බටහිර යුරෝපයේ ධනේශ්වරය හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ සමඟ සන්ධානයන්ට ඉව අල්ලමින් සිටියේය. මෙම සම්බන්ධයෙහි පදනම වූයේ, ධනේශ්වර පාලනයට කම්කරු පන්තිය දේශපාලනිකව යටත් කිරීමයි. වාමාංශය හා විප්ලවවාදී ව්‍යාපාරය, දේශපාලනිකව හා ශාරීරිකව යටත් කිරීමෙන් ස්ටැලින්, යුරෝපීය ධනේශ්වරයෙන් අනියම් උපකාර බලාපොරොත්තු විය. එහි ප්‍රතිපල වශයෙන් ඇතිවුනු "මහජන පෙරමුනු" සංධානයන්, "ධනේශ්වර ලිබරල්වාදයේ හා රුසියානු රහස් ඔත්තු සේවය වූ ජීපීයූ සන්ධානයන්" ලෙස ට්‍රොට්ස්කි සංක්ෂිප්ත ලෙස විස්තර කලේය.

1936 ප්‍රන්සයේ මැයි-ජූනි මහා වැඩ වර්ජනය, වෘත්තීය සමිති හා ස්ටැලින්වාදී ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂය විසින් විකුනා දමන ලදී. සමාජවාදී පක්ෂයෙන් හා ධනේශ්වර රැඩිකල් පක්ෂයෙන් සමන්විත මහජන පෙරමුනු සන්ධානය සමඟ පෙල ගැසෙමින් ප්‍රන්ස කොමියුනිස්ට් පක්ෂ නායක තෝරේස්, "යමෙක් වැඩ වර්ජනයක් අවසන් කල යුත්තේ කෙසේදැයි දැනගත යුතු" යයි ප්‍රසිද්ධියේ ප්‍රකාශ කලේය. ඩැලඩියර්ගේ කොන්සර්වේටිව් පක්ෂය බලයට ගෙන එමින් 1938 දී මහජන පෙරමුනු ආන්ඩුව බිඳ වැටුනි.

ස්පාඤ්ඤ විප්ලවයේදී හා ෆැසිස්ට් කුමන්ත්‍රනයේ නායක ජෙනරාල් ෆ්‍රැන්සිස්කෝ

ෆ්‍රැන්කෝට එරෙහි 1936-39 සිවිල් යුද්ධයේදී එක්සත් පෙරමුනු උපාය මාර්ගය, එරට කම්කරු පන්තිය, ධනේශ්වරයට බැඳ තැබීය. ආයුධ සන්නද්ධ කම්කරු හමුදා, ඔවුන්ගේ ආයුධ මැනුවෙල් අසානාගේ ධනේශ්වර ආන්ඩුවට බාර දිය යුතු යයි ක්‍රෙම්ලිනය දැඩි ලෙස කියා සිටි අතර, යුද ප්‍රයත්නය හා දේශපාලන හා මිලිටරියේ පාලනය ඔහු වෙතම තිබෙන්නට ඉඩහල යුතු බව ද අවධාරනය කලේය.

ට්‍රොට්ස්කිවාදීන් පෙන්වා දුන් පරිදි, අසානාගේ ආන්ඩුව ෆ්‍රැන්කෝට වඩා විප්ලවයට බියක් දැක්වීය. ෆ්‍රැන්කෝගේ ගොවි හමුදාව දිනා ගැනීම සඳහා, ඉඩම් ජනසතු කල යුතුය යන ඉල්ලීමට එය දැඩි ලෙස විරුද්ධ විය. විප්ලවය ස්පාඤ්ඤයෙන් පිටතට ගලායාම කෙරෙහි පැවති බිය නිසා සෝවියට් සංගමයේ හිතවතුන්ව සිටිය ද ප්‍රන්සය හා බ්‍රිතාන්‍යය, ස්පාඤ්ඤ සමූහාන්ඩුවට සහාය දීම මත බාධක පැනවීය. අවසාන ප්‍රතිපලය වූයේ ස්පාඤ්ඤ ෆැසිස්ට්වාදීන්ගේ ජයග්‍රහනයයි.

ට්‍රොට්ස්කි මෙසේ සිය අදහස් පල කලේයඃ "මෑත වසරවල ස්ටැලින්ගේ ජාත්‍යන්තර ප්‍රතිපත්තියේ මූලික පාවාදීම වූයේ මෙයයි. තෙල්, මැන්ගනීස් හා වෙනත් භාන්ඩ වෙලඳමේ යෙදී සිටිනවාක් මෙන්ම ඔහු, කම්කරු ව්‍යාපාරය තුල ද වෙලඳමක යෙදී සිටියි. මෙම ප්‍රවනතාවයේ අතිශයෝක්තියේ බිංදු මාත්‍රයක් වත් ඇත්තේ නැත. අධිරාජ්‍යවාදී බලවතුන් සමඟ කල ගනුදෙනු වලදී ස්ටැලින්, විවිධ රටවල කොමින්ටර්නයේ ශාඛාවන් හා පීඩිත ජාතීන්ගේ විමුක්ති අරගලය කෙරෙහි ද පල කලේ ඊට නොදෙවෙනි අල්ප වෙනසක් පමනි. [*"What lies behind Stalin's bid for agreement with Hitler?"* (හිට්ලර් සමඟ ගිවිසුම වෙනුවෙන් ස්ටැලින් තැබූ ලංසුව පිටුපස පැවතියේ කුමක් ද? එම, පිටු 235)]

සෝවියට් සංගමය තුල ද ස්ටැලින්, තමන් අලුතෙන් සොයාගත් අධිරාජ්‍යවාදී මිතුරන් තමන්ගේ අතිනත් ගැනීමට උත්සාහ දරන අතර, ඔහුගේ පාලනයට එරෙහිවූ මාක්ස්වාදී විරෝධය විරේක කිරීම මගින් දේශපාලන අත්‍යාජතියේ හිස ගසා දැමීමටත් වෙර දැරීය. 1936-38 මහා විරේකයන් හා මොස්කව් නඩු වලදී ස්ටැලින්, පැරනි බොල්ශෙවිකයන් හා සමාජවාදී බුද්ධිමතුන් විශාල සංඛ්‍යාවක් කොටුකර වනසා දැමීය. මාර්ෂල් තුකාෂෙව්ස්කි හා ජෙනරාල් ඉයෝනා යකීර් වැනි කෘතහස්තයන් ද ඇතුලු සෝවියට් හමුදා නායකත්වයේ හතරෙන් තුනක් පමන වෙඩිතබා මරාදැමීය. මෙය රතු හමුදාවේ යුද සූදානම කෙරෙහි ව්‍යසනකාරී බලපෑමක් ඇති කලේය.

ටොට්ස්කි මෙසේ ලිවීයඃ "පසුගිය වසර තුන තුලදී ස්ටැලින්, ලෙනින්ට හිත පක්ෂපාතකම් දැක්වූ සියල්ලන් හිට්ලර්ගේ ඒජන්තයන් ලෙස නම් කලේය. ඔහු හමුදා කාර්ය මන්ඩලයේ නිපුනයන් මුලිනුපුටා දැමීය. හිට්ලර්ගේ හෝ ඔහුගේ මිතුරන්ගේ ඒජන්තයන් ය යන එම චෝදනාව ම එල්ල කරමින් ඔහු, හමුදාවේ නිලධාරීන් 30,000 ක් පමන සේවයෙන් නෙරපා හැරියේය. නැත්නම් වෙඩිතබා මරාදැමීය. එසේත් නැත්නම් පිටුවහල් කලේය. පක්ෂය බෙදා වෙන් කිරීමෙන් ද, හමුදාවේ හිස ගසා දැමීමෙන් ද පසුව දැන් ස්ටැලින්, විවෘතව ම හිට්ලර්ගේ ප්‍රමුඛ තම ඒජන්ත තනතුරේ අපේක්ෂකයා වශයෙන් පෙනී සිටියි." [*"Stalin's Capitulation,"* (ස්ටැලින්ගේ යටත්වීම, එම, පිටු 254]

තමන්ගේම පිලිවෙත් දැඩි ලෙස වගකිව යුතුව තිබුනු යුද්ධයක්, වලක්වාගැනීම සඳහා ස්ටැලින් විසින් දරන ලද අවසාන වශයෙන් අසාර්ථක හා මංමුලා සහගත උත්සාහය මෙම පාවාදීම් මාලාවෙන් පසුව එලඹි හිට්ලර්-ස්ටැලින් ගිවිසුම මගින් නියෝජනය කලේය. දෙවසරකටත් අඩු කාලයකට පසුව, ජර්මනිය සෝවියට් සංගමය ආක්‍රමනය කල විට එරට, ඛේදනීය ලෙසින් එයට මුහුන දීමට නුසූදානම්ව සිටියේය. ෆැසිස්ට් ආක්‍රමනයට ප්‍රතිරෝධය පෑ සටන තුල ආසන්න වශයෙන් සෝවියට් සොල්දාදුවන් ද මහජනතාව ද මිලියන 30 පමන ජීවිත පුද කලහ.

කෙසේ වුව ද, සෝවියට් ජනතාවගේ ඇදහිය නොහැකි තරම් වූ කැපවීම, 1991 දී සෝවියට් සංගමය විසුරුවා හැරීම මගින් අවසාන වශයෙන් පාවාදෙනු ලැබිනි. එය ස්ටැලින්වාදයේ ප්‍රති විප්ලවවාදී ප්‍රතිපත්තියෙහි අවසන් ප්‍රතිපලය විය.

ඇලෙක්ස් ලැන්ටියර්